# ශ්‍රීලාල් ගේ කොළම

## (අ) මූලධර්මවාදයද? (ව්‍යාපාරික) ත්‍රස්තවාදයද?

''කාන්ති අක්කලා මේ සැරේ අලුත් අවුරුද්දට ඇදුම් ගන්න ගිහිල්ලා තියෙන්නේ කිරිබත්ගොඩ තිලකවර්ධන ටෙක්ස්ටයිල්ස් එකට.'' අල්ලපු ගෙදර ''කරන්ට් ඉෂූ'' එකක් අපේ ගෙදර මැද සාලෙට ආවේ ඔන්න ඔය විදිහට. ''ශීර්ෂ පාඨයේ'' ඕපාදූපයකට වැඩි යමක් නෑ. ඒත් ඊළඟට එන ''සවිස්තර වාර්තාව'' ඉතාම සුවිශේෂීයි. ''ඉස්සර කාන්ති අක්කලා යන්නෙම ''නෝ ලිමිට්'' එකටයි ''පැෂන් බග්'' එකටයිනේ. දැන් ඒවයින් ඇදුම් ගන්න එක නවත්තලා. කිරිබත්ගොඩින් හරි මහරගමින් හරි විතරලු ගන්නේ''

කෙනෙක් ඇඳුම් ගන්න මහරගම යනවා කියන එකේ නම් ඇති විශේෂත්වයක් නැහැ. මහරගම කිව්වට මොකද හරියටම කියනවා නම් මහරගම පමුණුවට. මීට අවුරුදු දහයකට දොළහකට ඉස්සර ලාබෙට ඇඳුම්-රෙදිපිළි ගන්න ගිය තරමක් සෙනග ගියේ පමුණුවට. පමුණුව පාර දෙපැත්තේ ලෑලි කඩ කාමරවල විතරක් නෙවෙයි පාර දෙපැත්තෙත් තාවකාලික අට්ටාල ගහගෙන රෙදි විකුණන වෙළෙන්දෝ පිරිලා. උත්සව කාලවලට පමුණුව පාරේ ''ඇඟල්ලක් ගහන්න ඉඩක් නෑ.'' ''ෂූ ගාලා'' සෙනඟ. පොරකෑවේ නැතත් රෙදිපිළි තෝරන්නේ තරඟයට වගේ. ඒ කාලේ අලුත් අවුරුද්ද ගැන ''ආටිකල් ලියන්න'' මාධ්‍යවේදියෝ මුලින්ම ''ගොඩබහින'' තැනක් තමයි පමුණුව. 2000 අවුරුද්දේ මමත් සන්ඩේ ලීඩර් මාධ්‍යවේදියෙක් විදිහට ඔය වැඩේට පමුණුවට ගියා දැනුත් මතක් වෙනවා.

කාලයක් තිස්සේ මේ විදිහට රෙදි-පිළි වෙළදාමෙන් පමුණුව ''වැජඹුණා.'' ඒ තත්ත්වය ක්‍රමයෙන් වෙනස් වෙන්න පටන් ගත්තේ ''ප්‍රෙන්ච් කෝනර්'', ''හවුස් ඔෆ් පැෂන්'', ''පැෂන් බග්'', ''නෝ ලිමිට්'' කිය කියා මහා පරිමාණ රෙදි පිළි ''මාළිගා'' කොළඹින් පටන් අරගෙන ක්‍රම ක්‍රමයෙන් රට පුරා ''පැටව් ගහන්න'' පටන්ගත්තට පස්සෙයි. මේවායේ හිමිකරුවන් වැඩි පිරිසක් මුස්ලිම් ජාතිකයන් බව දැන් දැන් තමයි අහන්න ලැබෙන්නේ. පමුණුවේ තරම්ම ලාබෙට නැතත් මේ රෙදි සාප්පුවලත් සාමාන්‍ය කෙනෙකුට මිලදීගන්න පුලුවන් මිල ගනන්වලට ඇඳුම් පැළඳුම් තියනවා. අනික පමුණුවේ ගිහින් ඉහින් කනින් දාඩිය පෙරාගෙන, දූවිලි නාගෙන, ''කට්ට කාගෙන'' ඇදුම් තොරණාවට වඩා මේ සාප්පුවලට ගිහිල්ලා නවී සැනසිල්ලේ ''ඒසී'' එකේ ඇඳුමක් තෝරගන්නකොට ගතට විතරක් නෙවෙයි හිතටත් හීන් සනීපයක් දැනෙනවා. මේ වෙනස කෙටි කාලයක් ඇතුලත පමුණුවේ රෙදිපිළි වෙළඳපොල ''බින්දුවට බස්සලා'' තියන හැටි අද පමුණුවට ගියාම බලාගන්න පුළුවන්. ඒ වුණත් අදටත් රෙදිපිළි ගන්න සැලකිය යුතු පිරිසක් පමුණුවට යනවා. ඒ නිසා කාන්ති අක්කලා ඇඳුම් ගන්න මහරගම යනවා කියන එකේ ලොකුවට හිතන්න දෙයක් නැහැ. හැබැයි කිරිබත්ගොඩ යනවා කියන එක නම් ඊට වැඩිය වෙනස්. කිරිබත්ගොඩ කවදාවත් රෙදිපිළි වෙළදාම් මධ්‍යස්ථානයක් විදිහට ප්‍රසිද්ධියට පත්වුණ නගරයක් නෙවෙයි. ''තිලකවර්ධන'', ''කැන්ඩි'' වගේ රෙදි සාප්පු කීපයක් තිබුණත් ඒව ජනාකීර්ණ වුණේ ඉතාම මෑතක. එහෙව් කිරිබත්ගොඩට කෙනෙක් දුර බැහැරක ඉඳලා ඇදුම් ගන්න එන එක එකපාරටම තේරුම් ගන්න අමාරු කාරණයක්. අනික මේච්චර කාලයක් ඇදුම් ගත්ත ''නෝ ලිමිට්'', ''පැෂන් බග්'' වගේ තැන් වර්ජණය කරලා?

අල්ලපු ගෙදර කාන්ති අක්කලාගේ ''කරන්ට් ඉෂූ'' එක අහන්න ලැබුණ දවසට කලින් දවසේ මම හිටියේ කැළණිය විශ්වවිද්‍යාලයේ. දවල් කෑම කෑවේ ගාල්ලේ චන්ද්‍රසිරි හාමුදුරුවොත් එක්ක ජිම් එකේ කැන්ටිමෙන්. කෑම කන ගමන් කොහොම හරි අපේ කතා බහ රටේ ''කරන්ට් ඉෂූ''වලට ''ප්ලග්'' වුණා. ''ඊයේ පැපිලියානේ 'පැෂන් බග්' එකට ගහලා නේද? ඒකේ මුස්ලිම් මනුස්සයෙක් ගෑණු ළමයෙක් දූෂණය කරලා.'' හාමුදුරුවෝ මට ''හොට් නිව්ස්'' එකක් ගෙනාවා.

''අනුරාධපුර මල්වතු ඔය ඩික්මන් පාරේ තියන මුස්ලිම් දහම් පාසල මාර්තු 31වෙනිදාට කලින් එතනින් අයින් කළේ නැත්නම් 'බොදු බල සේනා' සංවිධානය ඒක බලෙන් කඩලා අයින් කරනවා කියලා දැනුම් දීමක් කරලා තියනවලු. අනුරාධපුර එස්.එස්.පී. ඒක මහේස්ත්‍රාත් අධිකරණයට දන්වලා තියනවා. මැජෙස්ට්‍රේට් පොලිසියට කියලා තියනවා කිසිම ආගමික කණ්ඩායමකට නීතිය අතට ගන්න ඉඩ නොදී දැඩි ක්‍රියාමාර්ග ගන්න කියලා. ලෝයර්ස්ල කීපදෙනෙක්ම කියලා තියනවා මේ 'බොදු බල සේනා' කියන්නේ ආගමික සංවිධානයක් නෙවෙයි ගෝත්‍රික සංවිධානයක් කියලා.'' ඒ මම.

''රටේ නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා නම් බොදු බල සේනා එක නීතිය අතට ගන්නේ නෑනේ. මහත්තයා දන්නවද දැන් හුගදෙනෙක් 'නෝ ලිමිට්' එකට 'පැෂන් බග්' එකට රෙදි ගන්න යන්නේ නෑ. ඒවයේ බිස්කට් වර්ගයක් දීලා තියනවා කියනවානේ කාන්තාවන් වඳභාවයට පත්වෙන්න. හුග දෙනෙක් 'ෆුඩ් සිටි'වලින් බඩු ගන්නෙත් නෑ. බලන්ඩ මහත්තයා මේ යන විදිහට ගියොත් තව වැඩි කාලයක් යන්නේ නෑ මුස්ලිම් මිනිස්සු රට අල්ලනවා''

එතන ඉඳලා අපේ කතා බහ උණුසුම් සංවාදයක් බවට පත්වුණා. චන්ද්‍රසිරි හාමුදුරුවෝ දිගින් දිගටම 'සිංහල බෞද්ධයා' වෙනුවෙන් කරුණු ඉදිරිපත් කළා. මම දිගින් දිගටම 'බෞද්ධයා'ගේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කළා. කාන්ති අක්කලා ඇඳුම් ගන්න කිරිබත්ගොඩ ගිය කතාව පහසුවෙන් අවබෝධ කරගන්න අපි අතරේ සිදුවුණ මේ සංවාදය මට පිටුවහලක් වුණා.

කිරිබත්ගොඩ වගේම මහරගමත් සැළකෙන්නේ 'සිංහල බෞද්ධ' ප්‍රදේශ දෙකක් විදිහට. මහරගමටත් වඩා කිරිබත්ගොඩ 'සිංහල බෞද්ධ'කමට ප්‍රසිද්ධයි. ඒ කාලෙක ඉඳලා. කාන්ති අක්කලාගේ 'චේන්ජ් එක' දැන් පැහැදිලියි. ඇඳුම්වලට ප්‍රසිද්ධ තැන්වලින් අයින්වෙලා ඇඳුම් ගන්න කිරිබත්ගොඩ යන්නේ සිංහල බෞද්ධකම සලකලා. දැන් ඇඳුම්වලට වඩා ඇදුම් වෙළදාමෙදි 'මාකට් වෙන්නේ' සිංහල බෞද්ධකම. ඉතාම කෙටි කාලයක් තුළ 'සිංහල බෞද්ධකම' මේ විදිහට මාකට් කරන්න වැඩ කටයුතු සිද්ධ කළේ 'බොදු බල සේනා' සංවිධානය කියලා කිව්වොත් වැරදි නෑ.

'බොදු බල සේනාව' 'ආරම්භක වෙඩි මුරය' පත්තු කළේ පාරිභෝගික භාණ්ඩවලට 'හලාල් ලාංඡනය' යෙදීමට විරෝධය පළකරමින්. මේක සංස්කෘතික ආක්‍රමණයක් විදිහට හඳුන්වලා දුන්න 'බොදු බල සේනාව' ඊට විරුද්ධව ගෙන ගිය උද්ඝෝෂණය අවසානයේ ජයග්‍රහණය කළා. ඊට පස්සේ මුස්ලිම් ජාතිකයන්ගේ මස්කඩ වැටලීම වගේ වැඩවලට මේ 'සේනාව' අත තිබ්බා. ඊළගට මුස්ලිම් ව්‍යාපාරවලට පහර දෙන්න පටන්ගත්තා. මේ වෙනකොට මුස්ලිම් දහම් පාසල් ඉවත් කිරීම වගේ වැඩවලටත් බැහැලා ඉන්න මේ 'සේනාව' ඔවුන් හඳුන්වලා දෙන්නේ 'පොලිසියක්' විදිහට. ශ්‍රී ලංකා පොලිසිය රටේ නීතිය හා සාමය ආරක්ෂා කරනකොට බොදු බල සේනා පොලිසිය සිංහල බෞද්ධකම ආරක්ෂා කරන්නට ක්‍රියා කරන බව තමයි ඒ අය පුනපුනා කියන්නේ. හැබැයි මේක යට තියෙන්නේ ඔය කියන එකක්වත් නෙවෙයි 'ව්‍යාපාරික ත්‍රස්තවාදය' කියන එක දැන් පැහැදිලියි. අවසාන වටයෙදි ඇවිල්ලා තියෙන්නේ මුස්ලිම් ජාතිකයන්ගේ ව්‍යාපාර වර්ජණය කරන තැනකට. මේ වෙනකොට රටේ ප්‍රධාන නගර ගණනාවකම මුස්ලිම් ව්‍යාපාරිකයන්ට අයිති මහා පරිමාණ වෙළඳ ආයතනවල කටයුතු සිද්ධ වෙන්නේ විශේෂ පොලිස් ආරක්ෂාවක් යටතේ. කොයි වෙලාවක හරි 'දෙවන පොලිසියේ' ප්‍රහාරයකට ලක්වෙයි කියන බයෙන් තමයි ඒ අයට කටයුතු කරන්න සිද්ධවෙලා තියෙන්නේ.

මංගල සමරවීර 'බොදු බල සේනාව' මූලධර්මවාදී තලේබාන්ල විදිහට හඳුන්වලා තිබුණා මම පත්තරේක දැක්කා. තලේබාන්ල විදිහට හැඳින්වීම කෙසේ වෙතත් මූලධර්මවාදීන් ලෙස හැඳින්වීම වැරදියි කියන එකයි මගේ අදහස. අපි දන්න බුද්ධ ධර්මයේ මොන මූල ධර්මයද 'බොදුබල සේනාව' අනුගමනය කරන්නේ. බුදු දහමේ කිසිම මූලධර්මයක් ඒ අය අනුගමනය කරන්නේ නෑ. ඔවුන් ක්‍රියාකරන්නේ බුදු දහම තමන්ට ඕනේ විදිහට අර්ථ දක්වමින් ඒ අනුව. මේ කාලෙට ගැලපෙන නව ධර්ම දේශනා ක්‍රමයක් හඳුන්වා දෙන්නත් මේ අය බලාපොරොත්තුවෙනවා කියන ප්‍රවෘත්තියක් පහුගිය දවසක මම පත්තරේක දැක්කා. මේ විදිහට බුදු දහමේ හරයට සම්පූර්ණයෙන්ම වෙනස් ව්‍යාපාරයක නිරත මෙහෙම පිරිසකට 'මූලධර්මවාදීන්' කියන්න කොහෙත්ම හැකියාවක් නැහැ. ඔවුන් මූලධර්මවාදීන් නෙවෙයි අමූලධර්මවාදීන්. මට ඉස්ලාම් ආගම ගැන ලොකු අවබෝධයක් නෑ. ඒත් මට හිතෙන්නේ තලේබාන්ලත් මූලධර්මවාදීන් වෙන්න බෑ. කිසිම ආගමික සාශ්තෘවරයෙක් අනුමත කරන පිළිවෙතක් නෙවෙයි තලේබාන්ලා ක්‍රියාත්මක කරන්නේ. එතකොට මූලධර්මවාදීන් වෙන්න බෑනේ. අමූලධර්මවාදීන් වෙන්න ඕනේ. අමූලධර්මවාදීන්ගේ ව්‍යාපාරික ත්‍රස්තවාදය හෙට දවසේ අපිට මුහුණ දෙන්න සිදුවන ප්‍රබල අභියෝගයක් බවයි පෙනෙන්නේ.

ශ්‍රීලාල් සෙනෙවිරත්න




**The sun may rise on our beautiful land**
**It may seem we have tomorrow at hand**
**But tomorrow is later not today you see**
**It may wash away with the waves of the sea**
**We take everything for granted like bees their honey**
**Valuing this worthless price called money**
**Money does not buy the flowers their colour,**
**Nor the night the stars, or the sea its shimmer.**
**Money is just a piece of paper you see**
**Which can be torn in half so easily**
**We should value what is not easily broken**
**Like happiness which is our greatest token**
**A smile is indescribable**
**Nor is it replaceable**
**Enjoy everyday and moment at hand**
**Because tomorrow the sun may set on our beautiful land.**

In a place not far from ours lived two girls. One who lived in a grand home with multiple servants and a kitchen that was full. The other girl lived in the slums where her family was all she had and only had enough food to keep her alive. Both girls saw the world differently; the girl who lived in riches saw the world as a market where she was free to purchase anything she wanted. The other girl saw the world as a challenge where everyday she would go on a different adventure and discover something new. The girl who lived in riches was called Anastasia; although Anastasia had everything that a girl ever wanted she was never happy or satisfied. On the other hand Sarah the girl that lived in slums was always grateful although most nights she went to bed with an empty stomach.

Anastasia already had her future planned out for her, she would take over the family business so that she could keep all of her parents' riches. She was home schooled and had 3 different teachers come to her house and teach her. She was given everything she asked for from the latest trends to sport classes. Although she had everything she was never happy, she felt like there was apart of her missing. Her parents were always travelling so they were never home with her and she had no friends because she was homed schooled. When she grew up she did what her parents planned for her and took over the family business. She was one of the wealthiest women of her generation but rumours had it that she never smiled or laughed. She always looked empty and incomplete.



Sarah was not educated and had an uncertain future. Her parents provided her with everything that they could. Although Sarah hardly had a cent to her name she was always happy. When she grew up she became a volunteer and worked to help children that were like her when she was small. She was always smiling and willing to help. She had many friends and when ever some one needed help they would call Sarah.

Anastasia had everything that Sarah had except for happiness. She never valued the card that someone put thought and love into but instead praised the money that came with it. She valued money so much that happiness was not important to her. She grew up feeling alone and always wanting more because she was never happy with what she had. Sarah was different she was always happy although she had nothing. Her life felt complete because she valued everything big and small. Sarah would not just read the card but she would also frame it and hang it on her wall, she would not care if it came with money.

සිංහලෙන් පැය දෙකක්
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

රංජිත් රූබි සමඟ පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න